# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2009 අංක 5 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 පෙබරවාරි මස 18 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 පෙබරවාරි මස 20 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 4.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

# 2009 අංක 5 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 පෙබරවාරි මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 61/2007.

**1988 අංක 39 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2009 අංක 5 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1988 අංක 39 දරන පනතට 2අ වගන්තිය ඇතුළත් කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 39 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලබන අතර, එම වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

"ඇතැම් තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීම.

2අ. 2 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 1964 ඔක්තෝබර් මස 30 වන දිනට ඉන්දීය සම්භවය ඇත්තා වූ ද, ශ්‍රී ලංකාවේ ස්ථිරව වාසිකව සිටියා වූ ද යම් තැනැත්තකුට, එම තැනැත්තාගේ පාලනයෙන් බැහැර වූ අවස්ථානුගත කරුණු හේතුවෙන්—

(අ) ශ්‍රී ලංකාව හැරයාමට සිදු වූයේ නම් ; සහ

(ආ) ඉන් පසුව ඔහු ඉන්දියාවේ පදිංචි වූයේ නම්,

මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, එහි ප්‍රතිඵලයක් වශයෙන් 2 වන වගන්තියේ (අ) ඡේදයේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට, එම තැනැත්තාට නොහැකි වුව ද, එම තැනැත්තා එම වගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල නියමයන් සපුරාලන්නේ නම් හෝ එම තැනැත්තා ඉන්දීය සම්භවයක් ඇත්තා වූ ද, ශ්‍රී ලංකාවේ ස්ථිරව වාසිකව

සිටියා වූ ද තැනැත්තකුගෙන් පැවත එන තැනැත්තකු බවට සාක්ෂි ඉදිරිපත් කිරීමට ඔහුට හැකි නම්, එම තැනැත්තාට මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලපවත්වන පරිදි ශ්‍රී ලංකාවේ පුරවැසි තත්ත්වය හිමි වන අතර, එම තැනැත්තාට ශ්‍රී ලංකාවේ වෙනත් පුරවැසියන්ට නීතිය අනුව හිමිකම ඇති සියලු අයිතිවාසිකම් සහ වරප්‍රසාදවලට හිමිකම තිබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) “2 වන වගන්තිය හේතු කොට ගෙන” යන වචන සහ ඉලක්කම් වෙනුවට, “2 වන වගන්තියේ හෝ 2අ වගන්තියේ විධිවිධාන හේතු කොට ගෙන” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) “මේ පනතේ ‘ආ’ උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල විය යුතු ය.” යන වචන වෙනුවට “මේ පනතේ ‘ආ’ උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල විය යුතු ය :

එසේ වුව ද, 2අ වගන්තියේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසි තත්ත්වයට හිමිකම ඇති යම් තැනැත්තකු ශ්‍රී ලංකාවේ ස්ථිර වශයෙන් පදිංචිවීමේ චේතනාවෙන් ශ්‍රී ලංකාවට පැමිණීමේ දී පමණක් මේ පනත යටතේ පුරවැසිභාවය පිළිබඳ සහතිකයක් සඳහා ඉල්ලුම් කළ යුතු ය.” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.